// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2347/11 - 2023 අගෝස්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2023.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත මෙගාවොට් 134 සුළං බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිය (අදියර 2), පූනරින්, කිළිනොච්චි දිස්ත්‍රික්කය

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොළඹ 07, ආනන්ද කුමාරස්වාමී මාවත, අංක 72 දරන ලිපිනයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද යෝජිත පූනරින්, මෙගාවොට් 134 සුළං බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිය (අදියර 02) සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2023.08.31 දින සිට 2023.10.13 දින දක්වා දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර).

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, 12 වන මහල, "සෙත්සිරිපාය", අදියර 02, බත්තරමුල්ල.
02. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10.
03. මධ්‍යම පරිසර අධිකාරිය, අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
04. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අංක 811/A, ජයන්තිපුර මාවත, බත්තරමුල්ල.
05. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිළිනොච්චිය.
06. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පූනරින්.
07. ප්‍රාදේශීය සභාව, පූනරින්.
08. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, කිළිනොච්චිය.

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බැලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2023.08.31 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**ඉංජිනේරු ආර්. ඒ. එස්. රණවක,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාළිගාවත්ත,
කොළඹ 10.

දුරකතන අංක : 011 - 2449754, 011 - 2387922, 011 - 2449197.
ෆැක්ස් අංක : 011 - 2438005, 011 - 2472623.
ඊ මේල් : dg.ccd.lk@gmail.com

EOG 08 - 0278